වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

පරිසර අමාත්‍යාංශය

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

01. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මාලිගාවත්ත කොළඹ 10 පිහිටි ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය පහත උපලේඛන 01,02,03හි සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම සඳහා 2027 වර්ෂයට ලියාපදිංචි වීමට කැමති පිළිගත් සැපයුම්කරුවන් වෙතින් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

02. උපලේඛන 01,02,03 හි සඳහන් එක් එක් අයිතමයන් සඳහා වෙන් වෙන් වශයෙන් ආපසු නොගෙවන රු.1000/-ක මුදලක් දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත සමඟ තමන් විසින් සකස්කල අයදුම්පත්‍රයක් මගින් හෝ www.coastal.gov.lk වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත කර ඉදිරිපත්කල හැකිය.

03. භාණ්ඩ හා සේවාව සැපයීම වෙනුවෙන් ලියාපදිංචි වීමට අදහස් කරන ආයතන හා පුද්ගලයින්ට තම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්ද ,තම ආයතනය ලබා ඇති සුදුසුකම්/පළපුරුද්ද සනාථ කරන ලියවිලිද සමඟ අදාළ අයදුම්පත්‍රය 2026.12.04 දින සවස 2.00 ට පෙර අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,4 වන මහල,මාලිගාවත්ත, කොළඹ 10, ලිපිනය වෙත ලියාපදංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත්‍රය බහා එවන කවරවල වම්පස උඩ කෙළවරෙහි **" සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027"** CCD/Admin /A 10/Suppliers/2027 අංකය හා තමන් සැපයීමට බලාපොරොත්තුවන භාණ්ඩ හා සේවා පිළිබඳව පැහැදිලිව සටහන් කල යුතුය.

04. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් 2027 වර්ෂය සඳහා අදාල භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා මිලගණන් කැඳවනු ලබන අතර , වෙනත් සැපයුම්කරුවන් වෙතින් මිළ ගණන් කැඳවීම හෝ මිලට ගැනීම මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි සිදුකල හැකිය.

05. ඉල්ලුම් කල විට මිල ගණන් ඉදිරිපත් නොකරන්නා වුද, ඇණවුම් කල විට කලට වේලාවට භාණ්ඩ හා සේවාව නොසපයන්නා වුද, නිසි ප්‍රමිතියකින් තොරව භාණ්ඩ හා සේවා සපයන්නා වුද,සැපයුම්කරුවන්ගේ නම් පුර්ව දැනුම් දීමකින් තොරව ලියාපදිංචි ලේඛණයෙන් කපා හරිනු ලැබේ.

06. කොළඹ සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුල පිහිටි සේවා ස්ථාන කෙරෙහි වැඩි ප්‍රමුඛත්වයෙහිලා කටයුතු කරනු ලැබේ.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ශේප කරනු ලැබේ.

උපලේඛන 01

<u>සියළුම වර්ගයේ වාහන සඳහා අවශ්‍ය</u>

01. අමතර කොටස් සැපයීම.
02. අළුත්වැඩියා කිරීම (විදුලි හා යාන්ත්‍රික)
03. වායු සමන අළුත්වැඩියා කිරීම.
04. සේවා කිරීම.
05. පින්තාරු කිරීම හා ටින්කර් කිරීම.
06. වාහන කුෂන් වැඩ හා ඇතිරිලි වැඩ.

උපලේඛන 02

<u>සියළුම වර්ගයේ ඉදිකිරීම් යන්ත්‍ර සඳහා අවශ්‍ය</u>

01. අමතර කොටස් සැපයීම.
02. අළුත්වැඩියා කිරීම (විදුලි හා යාන්ත්‍රික)
03. වායුසමන අළුත්වැඩියාව කිරීම.
04. සේවා කිරීම.
05. තහඩුවැඩ සහ පින්තාරු කිරීම.
06. ලෝබෙඩ් රථ මගින් ප්‍රවාහනය කිරීම.

උපලේඛන 03

<u>ලිපිද්‍රව්‍ය සහ උපකරණ</u>

01. ලිපිලේඛන පරිවර්ථනය කිරීම.
02. වාහන සඳහා ටයර්,ටියුබ් සහ බැටරි සැපයීම.
03. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය සහ උපකරණ සැපයීම.
04. වාර සඟරා,කුඩා පොත් සහ ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම.
05. පොලිසැක් බෑග් (Polysack Bag ,Jumbo bags) සැපයීම.
06. පරිගණක සහ උපාංග
07. ටෝනර් සැපයීම (ෆොටෝකොපි යන්ත්‍ර සහ ප්‍රින්ටර් සඳහා)

මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේනම් වාහන සඳහා 0112444732 අධ්‍යක්ෂ (පාලන), ඉදිකිරීම් යන්ත්‍ර සඳහා දුරකථන අංක 0112449756 මගින් යාන්ත්‍රික ඉංජිනේරු ඇමතීමෙන් හා **ලිපිද්‍රව්‍ය සහ උපකරණ** (Stationary) සඳහා 0717133379 මිලදි ගැනීමේ නිලධාරි ඇමතීමෙන් ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
නව මහලේකම් කාර්යාලය, 4වන මහල, මාලිගාවත්ත, කොළඹ 10.

අයදුම්පත්‍රය

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

2027 වර්ෂය සඳහා වාහන/ ඉදිකිරිම් යන්ත්‍ර /**ලිපිද්‍රව්‍ය හා උපකරණ** අදාළ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය

ලියාපදිංචි සඳහා අවශ්‍ය කාණ්ඩය (උපලේඛන 01,02,03 හි සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම)

01. ඉල්ලුම්කරුගේ/ආයතනයේ නම: .....

02. ලිපිනය: .....

03. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය : .....

04. ආයතනය රක්ෂණය කර තිබේද?.....

(තිබේනම් පිටපතක් ඇමිණිය යුතුය)

05. වැට් ලියාපදිංචි අංකය : .....

(ලියාපදිංචි නම් සනාථ කිරීම සඳහා ලියවිලි අමුණන්න)

06. දුරකථන අංකය: .....

ෆැක්ස් අංකය : .....

විද්‍යුත් තැපෑල : .....

07. ණය පහසුකම් සැපයීමේ කාලය : .....උපරිම වටිනාකම : .....

08. භාණ්ඩ ගෙනවිත් භාර දෙන්නේද යන වග (භාණ්ඩ සැපයුම් කරුවන් සඳහා පමණි) ඔව්/නැත

දිනය .....

අයදුම්කරුගේ අත්සන හා

ව්‍යාපාර නිල මුද්‍රාව